පහන් වැට තුළට චිත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්




සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

සන්නස පහන් වැටෙහි අරමුණ කවියට, කලාවට ලැදි පරපුරක් බිහි කිරීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමයි. උපරිමයෙන් කවි පිටුව පුරවන්නේ ද මෙනිසාය. තතනමින් පද එකතු කර, කවියක් සේ තම සිතැඟි ඉදිරිපත් කරන කවරෙකුට වුවද සන්නසෙහි ඉඩ සැදෙනුයේ ඔහු මතු දිනයෙක දක්ෂ, යහපත් කවියෙකු වනු දැකීම උදෙසාය. පහන් වැට ඔබගේම වන්නේ ද එනිසාය.

*ඔබේ නිර්මාණ මෙම ලිපිනයට එවන්න.*

Sannasa Pahan Weta
61 Nattle Drive Hallam Vic 3803
Australia
**Email:** sannasanews@gmail.com

# පුංචි කුරුල්ලෙක්



කලබලයෙන් බලමින
දඟ කරමින් පැන පැන
මා අසලම ගැවසෙන
පුංචි කුරුල්ලෙක් කඩිසර
පුංචි කුරුල්ලෙක්

මෘදු නැති මෘදුකාංග තුළ
හිරවී ඇඹරුනු මොළේ
අස්වැසිල්ල සොයනා කල
දුටුවා නුඹ මා අසලම

අනේ අනේ බයක් නැතිව
මගේ ළඟටම ආ හැටි නුඹ

ඔබට එපා නම් ගන්නද
පුංචි කෝටු බිම තියෙන
මං හදනව ගේ පොඩ්ඩක්
උනුහුම් වී මට ඉන්නට

ගනින් ගනින් ඕනෙතරම්
ඕව බැහැනෙ විකුණන්නට

-කෙදිනද කූඩු හදන්නට එන්නේ
කෙදිනද කූඩු වෙලා අපි ඉන්නේ"
කනට වඩා හිතට වදින
ප්‍රශ්න දෙකකි හද තෙරපන

ගසක් යටට වී ඉඳගෙන
සිහිල් සුළං රැල් විඳ විඳ
ආසයි මං බලන් ඉන්න
ගුවන පුරා උඹ යන දෙස

උඹට කෝටු නිකන් ඇතේ
අපිට ගඩොල් නිකන් නැතේ
ඒ හින්දා ඉගිල යමන්
වැඩ ටික මගෙ පාඩු නොකර

*විශේෂ ස්තූතිය - වැඩ කරමින් ඉන්නා අතරේ මගේ ළඟට ආ කුරුලු පැටවාට*

අනුෂ්ක තිලකරත්න

# විශාලම පිංතූරය

පියාපතින්
නිදහස් අධ්‍යාපනයේ
පියා සරනුයේ
ඉහළින්,
දෑස් විදා බලනුය,
හැකි විශාලම පිංතූරය..
ළිඳට රිංගනු මන්ද
ලද පියාපත් සියතින් සිඳ
මැඩි සංගීතය මිස
නව රිද්ම කණට නුහුරු නිසා වෙද
කපුටෙකු මෙන් නොව කුණු ඇද ඇද
කොට්ටෝරුවකු මෙන් නොව ඔකඳව කොට කොට
කොකෙකු මෙන් පෙන්නා යස සුදු සුදු
සැළලිහිණියෙකු වන්න රාහුල හිමි සෙවන විඳ විඳ

නිරූප කවිකාරගේ

# පැණයක් ?



අන්තර්ජාලයේ ප්‍රේම පණිවුඩ ලියන
S.M.S. හාදු වැසි වස්සන
විසි එක්වන සියවසේ
රාධා ද නුඹ
මගේ ලොකු මිණිපිරිය

දිවි මගේ සැඳෑ සමයේ හිඳ
මම දස දහස් වර ගෙන
යළි යළිත් කියවන
පපුතුරේ සඟවාන
යෞවනය කරා පියඹන
සෙනෙහෙ කොළයක රැඳි
පෙම් සුවය නොහඳුනන
අනේ ළඳ බොළඳිය
කියනු මැන මට
කවර නම් පෙම්වතිය වේ නුඹ
එකම එක පෙම් හසුනක ද නොලබන ?

**සුභාෂිණී හේරත්**
ඇට්වුඩ්

# දයාබර හිමියනි,

අට විසි වසරක්ම
සෙනෙහසින් හද බැතින්
ඔබට බැඳි ප්‍රේමයෙන්
පසුපසින් ආ මෙමට
අතීතයේ එක් කලෙක
ඔබ යොවුන් හද පිදූ
එහෙත් සමු ගෙන ගිය
ඇගේ සෙනෙහස
ඇගේ සුන්දරත්වය
බොළඳ තරුණෙකු ලෙසට
පුන පුනා කියද්දී
උපැස් යුවලින් වැසුණු
දුර්වල වූ මා නෙතින්
කඳුළු කැට වැටෙන බව
ඔබට පෙණුනේ නැද්ද?

ශ්‍රීමතී මෙලබර්න්

# වියෝගය

තුන් සිතම දුක්බරයි
ගතින් මම තනිවමයි
සොඳුරු මතකයන් අපේ
පෙළයි මා හද තැවි තැවී

කඳුළු මට හිමි දෙයයි
මගේ උරුමය එයයි
පීරමින් ජීවිත ගමනේ
සොයනවා දැන් සැනසුමක්

බුදු සමිඳුගේ දහම
බැති සිතින් අදහමින්
සංසාර නිමාවන්
සොයන්නෙමි එක සිතින්

**නිල්මිණී ප්‍රියදර්ශිකා**
ජර්මනිය



# මායිම් වැටේ මල් පඳුර

නිවස පිටුපස
මායිම් වැටේ පීදුන
මල් පඳුර මම සබඳ...
තනි අයිතියකා විලංගු නැත
අතු රිකිලි ගෙල මිරිකන
රළු පරළු අණ නැත
හිතු මනාපෙට
මල් පැළඳ ගනිමි සියොළඟ
කෙට්ටුම රිකිලි මත වුව
මලක් එල්ලමි සතොසින...
යන එන ගමන් රොනට
ගොඩ වන බඹරුන්ය
නම, ගම, මූණ අමතකා
එඳ මුවරඳින තුටු පහටු වන...
ඉදිරිපස ගෙමිදුල
ගෙහිමිගෙ අණසකා
හැම අතු රිකිල්ලම
ඔහුට ඕනෑම විදිහට...
ගසට ඕනෑම මුදුනක
මල් පැළඳ ගැනුම අකැප ය
විනය නීතිය...
වසන්තය පිණිස සැරසෙන
ගෙළයන
හිමිකරුගෙ
ප්‍රීතිය...

රවී සිරිවර්ධන

# ආරාධනයක්

සිතන්න මැතිදුනි
තවත් වරක් ඔබලා හරිද කියා
අවි ගත්තෝ අවියෙන්ම නසිති
බුදුහිමි පැවසුවා
කෝවිල් රට හැම තැන ඉදි වුයේ
දමිල උගතුන් හට නිසි තැන් දුන්නේ
බේදත් නොබලා,
ඔබලගෙ අය රට හැම තැන
සුවසෙ වෙසෙන්නෙ
ඇයි මැතිදුනි ඔබලා
උතුරෙ තනිවී ඉන්න සිතන්නෙ
රට හැම තැන සිංහල, මුස්ලිම්,
බර්ග, දෙමල එක්ව වෙසෙන්නෙ
උතුරට පමනක් ඇයි දමිල
එක ජාතියකට හිමි වන්නේ
දේවදත්ත අංගුලිමාල වැනි
මරුවන් බුදු හිමි ළඟ දනින් වැටී
හරි මග ගියේ පවින් මිදී
ප්‍රභාකරන් මැතිදුනි අසනු මැනවි
කමා කරලා
අවි බිම තියලා එන්න ඔබ ,
අප හා එක් වන්න මිතුරු වීලා

ශ්‍රියානි ග්රෑල්
ජර්මනිය

# සඳ මායිමෙන් මිදුණු සාවියට

සාවිය නැති පුන් සඳ
රැස් ප්‍රභා මිලාන වී
ඔහේ පාවෙනා
සඳ සාවී වළා පෙතක නැගී
මායිමෙන් මිදී ගිහින්
සඳ හිමි හා තරු දියණී
අහස් ගැබේ තනිකර දා
හමනා සුළං අතට
වළා යානය පාවී ගිහින්
කුලක හැපී බිඳී වැහි බිඳුව වී
කඩා හැලේවී ඔබ සමඟින්
තටු සිඳී කිරිල්ලියක සේ
ඔබ දූ කුමරී
පුංචි තාරකාවී
මව් නැති සොව
කෙසේ දරා ගනීවිද
ම මිතු සඳ කෙසේවතුදු
මග වැරදුණි නම් සාවියනි
රාත්‍රී අහසේ දිලිසෙන
සි ති තාරකාවිය දෙස
බලා ගෙනවත්
හනිකට එන්න
ඔබ නැති සඳ පාළුයි
සීතලයි චංචලයි
යන්න සඳ තුරුළට
නොවී පමා
සඳ පතුලේ මිදුණු සෙනේ
ඔබ උණුසුමින් දිය වී
ගලන්නට පටන් ගනීවී
ඔබ හැඩය ගනිමින්

නිහාල් රූපසිංහ

## *Shame*

*Shame, shame, shame*
*They say it's a shame*
*For a woman to talk aloud*
*And laugh aloud*
*If she doesn't smile, they say she is proud*
*She must always live to please the crowd*
*She is not free to say*
*What is right and what is wrong*
*It is supposed to be a shame !*

*Her freedom is always taken for a song !*
*She must always be good looking*
*And do best in cooking*
*Otherwise it is a shame!*
*It is also a shame to fall in love*
*Or to choose the way she likes*
*For these she suffers pressure and spikes*
*Chastity counts, she must obey and give*
*She must be a slave if she wants to live !*

*It is a shame I say*
*When things are this way*
*Is it a shame to be a woman?*
*No, it is only discrimination*
*Against the women who is also human*
*It is time to pay heed with consideration*
*That woman is equal to man in every way*
*Otherwise it is an utter shame I've got to say !*

*Shame, shame, shame!*

*Mallika* Berlin

# රාහුල වන් සෝපාකත්

| | |
|---|---|
| සුරතල් කලදි පිය සෙනෙහස | අහිමි වුණා |
| දරුවෙකි සෝපාක දඟ කර | සිනා සුණා |
| ජීවිත දැහැන ගැට ගැසුමට | සහාය දුන |
| මව වෙත පැමිණි සුළු පියතුම | රුදුරු අණා |
| කලකදි මවට ලැබු දරුවා පුතු | හන්දා |
| වැඩි සෙනෙහසක් ඔහුටම සුළු | පිය රන්දා |
| වෛරය නිසා දොස් නැග වරදට | බැන්දා |
| වේවැල් පහර කා නිතරම | දුක් වින්දා |
| දිනකදි රැයේ ඇද ගෙනගොස් සොහොන | වෙත |
| මිනියක් පිට මැදින් තබලා වෙළුව | යොත |
| රැය තුළ මිනී කෑමට එන සතුන් | වෙත |
| අත හැර ගියා ගල් වූ හද නොමැති | තෙත |
| ළං වන විටදි හිවළුන් රැළ මිනි | ගඳට |
| අඬමින් කෑ ගැසුවා ඇද ගෙන | යන කලට |
| මහා රෑ පිහිට වන්නේ කව්රුද | ඔහුට |
| හෝරා කීපයක් ගත විය තනිව | සිට |
| අළුයම හිරු නැගී උණුසුම දෙන්න | පෙර |
| බුදු හිමි පිබිදිලා තුන් ලෝ බලන | වර |
| කරුණා නෙතට ගැටුණා දරුදුක | එවර |
| එසැණින් මිදුණි දරුවගෙ බැඳි | මිනී බර |
| රාහුල පුතුන් සත්විය ඉක්මවා | ඇත |
| සෝපාකගේ වයසත් ඒ වටා | ඇත |
| දෙදෙනට බුදු සෙවනෙ සම මෙත ලැබී | ඇත |
| විදසුන් වඩන්නට දෙදෙනම සමත් | ඇත |
| බුදු හිමි සතුව ඇති මහා කරුණා | ගුණයෙන් |
| අරමට පැමිණි ඔහු වෙත දුන් පැවිදි | බවෙන් |
| සසරේ නිමක් නැතිවම එන දුක් | ගින්නෙන් |
| මිදෙනට හැකි වුණා පින රැයෙ මතු | වීමෙන් |

වසන්තා විජේවර්ධන පර්ත්

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.